# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1954/7 – 2016 පෙබරවාරි මස 15 වැනි සඳුදා - 2016.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## අතුරු ව්‍යවස්ථා

### මධ්‍යම පළාතේ පළාත් සභාව

................................. නගර සභාව

**ආපදා කළමනාකරණය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

255 වැනි අධිකාරය වන නගර සභා ආඥපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥපනතේ 157 වැනි වගන්තිය ප්‍රකාරව ආපද කළමනාකරණය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවලට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා මධ්‍යම පළාතේ නගර සභාවලට බලය පවරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2016 ජනවාරි මස 05 වැනි දින,
පල්ලේකැලේ,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*ආපද කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. 255 වන අධිකාරය වූ නගර සභා ආඥපනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු 157 වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

2. මේ අතුරු ව්‍යවස්ථා, ආපද කළමනාකරණයට අදළ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අතිරේකයක් ලෙස මිස, එකී යම් විධිවිධානයක බලය හීන කරවන්නේ යයි හෝ එම විධිවිධානවලට අතිරේකයක් ලෙස මිස, එකී යම් විධිවිධානයක බලය හීන කරවන්නේ යයි හෝ එම විධිවිධානවලට ආදේශකයක් වන්නේ යයි නොසැළකිය යුතුය.

අතුරු ව්‍යවස්ථාවේ නාමය

3. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ ආපද කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

4. නගර සභා බල ප්‍රදේශය තුළ ඇති වීමට ඉඩ ඇති ආපද අවස්ථා අවම කිරීම, එවැනි යම් ආපදවකදී අපහසුතාවට පත්වන්නන් හෝ පත්වීමට ඉඩ ඇති තැනැත්තන්ට සහන සැලසීම සහ සභා බල ප්‍රදේශයේ ආපද අවස්ථාවකදී ඊට මුහුණදීමට හැකි වන අයුරින් පූර්ව සූදනම් කිරීම සඳහා ද ආපද අවදනම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කල යුතු පූර්ව ආපද ක්‍රියාදමයන් සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික සියලු කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මේ අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

ඉටුකළ යුතු කාර්යයන්

5. නගර සභා බල ප්‍රදේශය තුළ ඇති විය හැකි ආපද කළමනාකරණය කිරීම, සහ එවැනි යම් ආපද තත්ත්වයක් ඇති වූ විට එම ආපදාවන්ට ලක් වූ හෝ ලක් විය හැකි අයට සහන සැලසීම හා ආපද අවදනම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු පූර්වෝපායන් නිර්ණය කිරීම නගර සභා ආපද කළමනාකරණ කමිටුව මගින් සිදු කළ යුතුය.

6. කමිටුවේ සංයුතිය

5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව 23කට නොවැඩි විය යුතු අතර, කාන්තාවන්ද, නියෝජනය වන පරිදි එම සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු නගර සභාවේ සභාපතිවරයා
(ii) කමිටුවේ ලේකම්වරයා විය යුතු නගර සභාවේ ලේකම්වරයා
(iii) සෑම වර්ෂයකම දෙසැම්බර් මස මහ සභාවේ දී ඉදිරි වර්ෂය සඳහා ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන නගර සභාවේ සභිකයන් හතරදෙනෙකු
(iv) නගර සභාවේ තාක්ෂණ නිලධාරි
(v) නගර සභාවේ ගිණි නිවීමේ අංශයේ ස්ථානභාර නිලධාරියා/ප්‍රධාන ගිණි භට
(vi) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ පත්කරනු ලැබ ඇති දිස්ත්‍රික් ආපද කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු
(vii) සභා ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු
(viii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් නම් කරන යම් නියෝජිතයෙකු
(ix) සභා ප්‍රදේශය ඇතුලත් වන පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු
(x) සෑම වර්ෂයකම දෙසැම්බර් මස මහා සභාවේදී යෝජනා සම්මතයෙන් ඉදිරි වර්ෂය සඳහා තෝරාපත් කර ගනු ලබන

(අ) අවම වශයෙන් සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක නාගරික සංවර්ධන උපදේශක කමිටුවේ නියෝජිතයන් තුන්දෙනෙකු
(ආ) සභා ප්‍රදේශයේ රජයේ පාසල් ඇතුලත් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු
(ඇ) සභා බල ප්‍රදේශයට අයත් වාණිජ මණ්ඩලය හෝ වෙළඳ සංගමයේ නියෝජිතයෙක්
(ඈ) ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරි හෝ ඔහුගේ නියෝජිතයෙකු
(ඉ) ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ස්ථානභාර නිලධාරි හෝ ඔහුගේ නියෝජිතයෙකු
(ඊ) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයෙක්
(උ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජිතයෙක්
(ඌ) පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙක්

ඉහත 6(iii) වන අනුඡේදය යටතේ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ යම් සභිකයෙකු කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම නිසා හෝ වෙනත් කවර හෝ හේතුවක් මත සභාවේ ධූරය හිස් කිරීම නිසා හෝ කමිටුවේ සාමාජික ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන යම් අවස්ථාවක, එසේ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ ඊළඟ රැස්වීමේදී එකී පුරප්පාඩුව සඳහා සභාවේ වෙනත් යම් සභිකයෙකු ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු

අතර එසේ තෝරා පත් කර ගනු ලබන සභිකයාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින තෙක් ඒ සාමාජික ධූරයේ කටයුතු කරනු ලැබිය යුතුය.

කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ යම් තැනැත්තෙකු කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම නිසා හෝ වෙනත් කවර හෝ හේතුවක් මත කමිටුවේ සාමාජික ධූරය හිස් කිරීම නිසා හෝ කමිටුවේ සාමාජික ධූරයක පුරප්පාඩුවක් ඇතිවී තිබෙන යම් අවස්ථාවක එසේ පුරප්පාඩුව ඇති වීමෙන් පසුව පවත්වනු ලබන මහා සභාවේ ඊළඟ රැස්වීමේදී එකී පුරප්පාඩුව සඳහා වෙනත් යම් තැනැත්තෙකු පත්කර ගනු ලැබිය යුතුය. තවද එසේ තෝරාපත් කරගනු ලබන තැනැත්තාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින තෙක් ඒ සාමාජික ධූරයේ කටයුතු කරනු ලැබිය හැකිය.

ඉහත 6 (iv)(v) සහ (ix) වන අනුඡේදවල සඳහන් කිසියම් නිලධාරියෙකුට යම් කමිටු රැස්වීමකට පෞද්ගලිකව සහභාගිවීමට නොහැකි වන අවස්ථාවක ඔහු විසින් නම් කරනු ලබන හා ඔහුගේ රාජකාරි ආවරණය කරනු ලබන වෙනත් නිලධාරියෙකු ආයතන ප්‍රධානියාගේ අනුදැනුම ඇති ව කමිටු රැස්වීමට සහභාගි කරවිය හැකිය.

7. (1) අවම වශයෙන් සෑම මාස දෙකකට එක් වරක් හෝ කමිටුවේ සාමාන්‍ය රැස්වීමක් පැවැත්විය යුතුය. කමිටුවේ සභාපතිවරයා විසින් උචිත යයි අදහස් කරනු ලබන යම් අවස්ථාවක කමිටුවේ විශේෂ රැස්වීම් කැඳවීමට කමිටුවේ සභාපතිවරයාට බලය තිබිය යුතුය.

(2) කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය, සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති යම් අවස්ථාවක සභාවේ උපසභාපතිවරයා විසින් හෝ දරනු ලැබිය යුතුය. සභාවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා යන දෙදෙනාටම යම් කමිටු රැස්වීමකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් 5 වන අතුරු ව්‍යවස්ථාවේ (I) (iii) අනුඡේදයේ සඳහන් සභාවේ සාමාජිකයින් අතුරින් කෙනෙකු එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාපත් කරගනු ලැබිය යුතුය.

(3) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය මුලු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(4) කමිටුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම එදින රැස්වීමට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(5) සභාවේ ලේකම්වරයා විසින් කමිටුවේ දී ගනු ලබන තීරණ වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර කමිටුවේ ඊළඟ රැස්වීමේදී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමග ඒවා ස්ථිර කරනු ලැබූ විට කමිටුවේ මූලාසනය දරනු ලබන තැනැත්තා විසින් එයට අත්සන් තැබිය යුතුය.

8. කමිටුවේ කිසිදු ක්‍රියාවක් හෝ කාර්යයක් ඒ කමිටුවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමේ දී යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු හෝ බල රහිතව වන ලෙස සලකනු නොලැබිය යුතුය.

9. කමිටුවේ සෑම රැස්වීමකම වාර්තා එළඹෙන නගර සභාවේ මහා සභා රැස්වීමේ දැන ගැනීම සඳහා සභාගත කළ යුතුය.

10. කමිටුව විසින් මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන යම් නිර්දේශ වන්නේ නම්, ඒවා සම්බන්ධයෙන් සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව මහා සභාව විසින් සලකා බලනු ලැබිය හැකිය.

11. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ සඳහන් කාර්යයන් කමිටුවේ කාර්යය විය යුතුය.

12. (1) සභාපතිවරයා සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළඳ ස්ථානයක දෛනික කාර්යයන් අවසානයේ එකී කාර්යාලය හෝ වෙළඳ ස්ථානය වසා දැමීමට පෙර, ඒ පරිශ්‍රය ඇතුළත දල්වා තබන ලද

(අ) භූමිතෙල් භාවිතා කරන ලාම්පුවක් හෝ
(ආ) පොල්තෙල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් දල්වා තබනු ලබන යම්කිසි පහනක්
(ඇ) හඳුන්කූරක් හෝ එවැනි වෙනත් යම් දෙයක් හෝ

(ඈ) එවැනි විවෘත දැල්ලක් සහිත වෙනත් යම් දෙයක්, හෝ නිවා දැමීම කළ යුතු බවට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළඳ ස්ථානයක හිමිකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී යම් ස්ථානයක භාරකරු හෝ විසින් (1) ඡේදයේ සඳහන් නියමය පිළිපැදීමට යටත් තැනැත්තා වන අතර ඔහු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු ලවා හෝ එසේ කිරීම සැලැස්වීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතුය.

නොකළ යුතු කාර්යයන්

13. සභා ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති ඛණිජ තෙල් පිරවුම් ස්ථාන, ඛණිජ තෙල් ගබඩා කිරීමේ ස්ථාන, එල්. පී. ගෑස් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණනු ලබන ස්ථාන සහ එල්. පී. ගෑස් ගබඩා කරන ටැංකි පවත්වාගෙන යනු ලබන ස්ථානවල -

(1) (අ) ගිනි දැල්වීම හෝ ගිනි දැල්වීමට ඉඩ දීම හෝ
(ආ) යම් තැනැත්තෙකු විසින් විවෘත ගිනි දැල්ලක් ඇති ව සිටීම හෝ සිටීමට කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

(2) රක්ෂණ සහතිකයක් සහ ගිනි නිවීමේ උපකරණ හා ද්‍රව්‍ය නොමැතිව ව්‍යාපාර පවත්වාගෙන යාම නොකළ යුතුය.

14. සභා ප්‍රදේශය ඇතුලත පිහිටා ඇති කාර්යාල සහ වෙළඳ ස්ථාන පවත්වාගෙන යනු ලබන කිසියම් ගොඩනැගිල්ලක විදුලි පරිපථ පූර්ණ ආරක්ෂාව සහිතව සවිකර පවත්වාගෙන යාම එකී ගොඩනැගිල්ල හිමිකරුගේ සහ පදිංචිකරුගේ කාර්යය විය යුතු අතර අනාරක්ෂිත විදුලි රැහැන් ඇදීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකල යුතුය.

15. සභා බල ප්‍රදේශය ඇතුලත පුද්ගලික හෝ රජය සතු ඉඩම්වල ස්වභාවිකව වැසි ජලය බැස යාම අවහිර වන සේ ඉඩම් කට්ටි කිරීම, තාවකාලිකව හෝ ස්ථිරව ගොඩනැගිල්ලක් හෝ තාප්පයක් හෝ බැම්මක් ඉදිකිරීම නොකළ යුතුවේ.

16. සභා බල ප්‍රදේශයේ ස්වභාවික උවදුරුවලට ගොදුරු විය හැකි ඉඩම්වල මෙන්ම අංශක 30 වඩා වැඩි බෑවුම් සහිත ඉඩම්වල සභාවේ අනුමැතියකින් තොරව නිවාස ඉදිකිරීම නොකළ යුතුවේ.

17. ස්වාභාවික බෑවුම අංශක 30ට වඩා වැඩි ඉඩම්වල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව පිළියෙල කරන ලද නිර්ණායකයන්ට අනුකූල නොවන සේ පස් කැපීම හෝ ඉවත් කිරීම සිදු නොකළ යුතුය.

පළාත් පාලන ආයතනයේ කාර්යය භාරය

18. (1) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පෙර ආපදාවලට ලක්වූ හා ලක්විය හැකි ප්‍රදේශයන් දක්වෙන සිතියම් සකස් කර දත්ත ගබඩාවක් පවත්වාගෙන යා යුතු අතර මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රදර්ශනය කළ යුතුය.

(2) බල ප්‍රදේශයේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි ස්ථාන සිතියම් ගත කිරීම හා ඒ පිළිබඳව මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

(3) ආපදා අවදානම් ස්ථාන පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස භාෂා ත්‍රිත්වයෙන් පුවරු සවිකර යාවත්කාලීන කළ යුතුය.

(4) ආපදාවට ලක්විය හැකි බවට හඳුනාගත් ප්‍රදේශවල සිදුවිය හැකි ආපදා අවම කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදළ අනෙකුත් ආයතන දැනුවත් කර ඔවුන්ගේද සහය ඇතිව ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

19. (1) සියළුම සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අදල අනුමැතිය ලබාදීමේදී අදාළ ප්‍රදේශයේ පවතින ආපදා තත්වයන් පිළිබඳ ඇගයීමත්, ආපදා අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාගත යුතු අතර අධි අවදානම් තත්වයන්ට ලක්විය හැකි වන්නේ නම් ආපදා අවම කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත කොට වරලත් ඉංජිනේරුවකු/වාස්තු විද්‍යාඥයෙකු/භූ විද්‍යාඥයෙකුගේ සහතිකයක් සහිතව සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

(2) බල ප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දැනට ආපද කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිහිටුවා ඇති ආපද කළමනාකරණ කමිටු සමග සම්බන්ධව කටයුතු කළ යුතුය.

20. ආපදවන්ට ලක්වූ ප්‍රදේශය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධ කර ගෙන ආපදවන්ට ලක් වූවන්ට සහන සැලසීම සඳහා දැනට රජයේ ක්‍රියාත්මක වන ක්‍රමවේදය තුළට සම්බන්ධව වී කටයුතු කළ යුතුය.

21. ආපද තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන බවට ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව කමිටුව විසින් හඳුනාගනු ලැබූ,

(1) ආපද අවදනම් කලාප, ඒ එක් එක් කලාපයට ආපද ඇති වීමට බලපාන හේතු සහ ප්‍රදේශය ආපදවකදී එයින් පීඩාවට පත් වන්නන් ඉවත් කර ගැනීමට වඩාත් සුදුසු මාර්ග හා අවතැන් වූවන් තාවකාලිකව රඳවා තැබිය හැකි ස්ථාන කවරෙද යන්න පහසුවෙන් සොයා ගත හැකි ආකාරයට සිතියම් ගත කිරීම සහ එම සිතියම් යාවත්කාලීනව පවත්වා ගැනීම.

(2) ආපද අවදනම් කලාප ඇතුළත පදිංචි ජනතාවගේ ජන ජීවිතයට කිසියම් බලපෑමක් ඇති කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් වෙන් වෙන්ව නිශ්චිතව හඳුනාගැනීම.

(3) ආපද අවදනම් කලාප ඇතුළත මහා පරිමානයේ ආපදවක් හේතුවෙන් අවතැන්වීමට ඉඩ තිබෙන පවුල් තාවකාලිකව පදිංචි කරවීම සුදුසු බවට කමිටුව විසින් හඳුනාගනු ලැබ තිබෙන ස්ථානවලට අවශ්‍ය උපකරණ සපයා ගැනීම සඳහා අදාළ ආයතන හඳුනාගෙන තිබීම.

(4) ආපද අවදනම් තත්ත්වයන් අවම කිරීම සහ ආපදවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා කාර්යයන් සභාවේ සභිකයන්, ප්‍රජාව ආපද කළමනාකරණ මධ්‍යස්ථානය සහ වෙනත් පාර්ශ්වකරුවන් සමග එක්ව හඳුනාගැනීමට ක්‍රියා කිරීම.

(5) ආපද අවදනම් තත්ත්වයන් අවම කිරීම හා ආපදවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමේ ප්‍රමුඛතා සැලසුම් කිරීම සහ එකී සැලසුම් යාවත්කාලීන කිරීමට ක්‍රියා කිරීම සහ

(6) ආපද තත්ත්වයක් ඇතිවූ අවස්ථාකව එහි පදිංචි ජනතාවට සහන සැලැසීම සඳහා කමිටුව විසින් හඳුනා ගෙන ඇති කණ්ඩායම් සාමාජිකයන්ට ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ සහය ඇතිව සහන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම නගර සභාවේ කාර්යය විය යුතුය.

22. (1) ව්‍යවසන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන තාක්ෂණික ආයතනවල උපදෙස් මත ආපද කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් වාර්තා තබාගැනීම සඳහා සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු නිශ්චිතව යෙදවීම සභාවේ කාර්යය භාරය වන්නේය.

(2) සභා බල ප්‍රදේශයට බලපෑ හැකි උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන ආපද කළමනාකරණ කමිටුවට කමිටුවේ සභාපතිවරයාට හෝ කමිටු සාමාජිකයන්ට දැනුම්දීම කාර්යය පැවරූ නිලධාරියා හෝ සේවකයාගේ වගකීම වන්නේය.

(3) නගර සභා බල ප්‍රදේශයේ කිසියම් ආපද අවදනම් කලාපයක ආපද අවදනමක් ඇති වීමට ඉඩ ඇති අවස්ථාවක, හෝ එවැනි අවදනම ඇතිවී තිබෙන අවස්ථාවක, අවදනමට ලක්වීමට ඉඩ ඇති හෝ අවදනමට ලක් වූ තැනැත්තන් වෙත සහන සැලසීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න තීරණය කිරීම කමිටුව විසින් කරනු ලැබිය හැකිය. ආපදවන්ට ලක් වූවන්ගේ ජීවිත ආරක්ෂාව, ආහාර, පානීය ජලය, ඇඳුම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ යන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණයක් හෝ තීරණ ගැනීම සඳහා කමිටුව රැස්කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව සභාපතිවරයාගේ මතය වන විට, ඒ අවස්ථාවේදී කළ යුතු සහන සැලසීම පිළිබඳ තීරණ ගැනීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද තමා විසින් ගනු ලැබූ තීරණය හෝ තීරණ කවරේද යන්න කැලැන්ඩර දින තුනක් ඇතුළත කැඳවනු ලබන කමිටුවේ රැස්වීම ඉදිරිපත් කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(4) (3) ඡේදයේ සඳහන් ආකාරයට කමිටුව විසින් හෝ සභාපතිවරයාට විසින් ගනු ලැබූ තීරණයක් හෝ තීරණ යටතේ ආපදවට ලක්වූ තැනැත්තන්ට සහන සැළසීම කළ හැකි අතර ඒ වෙනුවෙන් නගර සභා අරමුදලෙන් වියදම් කරනු ලැබිය හැකිය.

(5) (3) ඡේදයේ සඳහන් ආකාරයට කමිටුව විසින් හෝ සභාපතිවරයා විසින් ගනු ලැබූ තීරණ, ඒ තීරණයන් අනුව (4) ඡේදය යටතේ ගනු ලැබූ ක්‍රියා මාර්ග සහ ඒ වෙනුවෙන් සභා අරමුදලෙන් දරනු ලැබූ වියදම් කොපමණ ද යන්න පිළිබඳව කමිටුව විසින් පිළියෙල කර සවිස්තර වාර්තාවක් ඒ කාර්යයෙන් පසුව එළඹෙන සභාවේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතුය.

23. සභා බල ප්‍රදේශයේ ස්වභාවික ආපදාවලට ගොදුරු විය හැකි ඉඩම් මෙන්ම බෑවුම් $30^0$ වැඩි ඉඩම් හඳුනා ගැනීම සඳහා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහාය ලබාදිය යුතුය.

24. සභා ප්‍රදේශයේ ජල ගැලීම්වලට පාත්‍රවන ප්‍රදේශ හඳුනාගෙන සිතියම් වල සලකුණු කිරීම හා එම එක් එක් ප්‍රදේශවල උපරිම ජල මට්ටම, වර්ෂාපතනය හා අනෙකුත් සාධක පාදක කරගත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් හෝ පසුගිය අත්දැකීම් මත තීරණය කර, නිවාසවල අත්තිවාරම් මට්ටම සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

25. සභා බල ප්‍රදේශය තුළ පතිත වන වර්ෂා ජලය බාධාවකින් තොරව ගලා යෑමට හැකිවන ආකාරයෙන් මතුපිට ජලපවාහන පද්ධතිය ඉදිකිරීම, නඩත්තුව සහ වැසි ජලය ගලා යෑමට පවතින අවහිරතා මග හැරවීමට ක්‍රියා කිරීම සභාවේ කාර්යය විය යුතුය.

(1) සභා බල ප්‍රදේශයේ රජයේ හා පුද්ගලික ඉඩම්වල ඉඩම් අනු බෙදුම් ඉල්ලුම් අනුමත කිරීමේ දී වැසි ජලය ආපදා තත්ත්වයක් ඇති නොවන සේ ක්‍රමානුකූලව බැහැරලීමට අවශ්‍ය කාණු පද්ධතිය සැලසුමට ඇතුලත් කර ඇති බව සහතික කළ යුතුයි.

(2) සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබා දීමේදී අදළ ඉඩමේ කට්ටි සැළැස්ම සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති බවට සනාථ කර ගත යුතුවේ.

26. සභා ප්‍රදේශය ඇතුළත ඇති නිවාසවල, වෙළඳ ස්ථානවල සහ වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ප්‍රයෝජනයට ගනු ලබන එල් පී ගෑස් සිලින්ඩරවලට සම්බන්ධ කරනු ලබන උපාංග වලින් හෝ ඒ උපාංග එකිනෙකට සම්බන්ධ කරන ස්ථානවලින් එල්. පී. ගෑස් කාන්දුවීමකින් තොරව පවත්වාගෙන යාම සහ ඒ පිළිබඳ පූර්වාරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් සභා ප්‍රදේශයේ පදිංචි සහ ප්‍රදේශය තුළ ව්‍යාපාරයන් හි නියුක්ත තැනැත්තන් දැනුවත් කිරීමට ක්‍රියා කිරීම නගර සභාවේ කාර්යය විය යුතුය.

27. එල්පී ගෑස් භාවිතා කරමින් පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී ගිනි රක්ෂණ ආවරණයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, ගිනි රක්ෂණ ආවරණයක් නොමැතිව එවැනි ව්‍යාපාර පවත්වාගෙන යෑමට ඉඩ නොදිය යුතු ය.

28. නගර සභාව තුළ පවත්වාගෙන යන ජනතාව විශාල වශයෙන් ඒකරාශිවන උපකාරක පන්ති, වෙළඳ සංකීරණ වැනි ස්ථානයන්හි සිදුවිය හැකි ගිනිගැනීම් වැනි උවදුරු අවස්ථාවලදී ඉතා කෙටි වේලාවකින් ජනතාව ඉවත් කිරීමට හැකිවන අයුරින් අවශ්‍ය ප්‍රමාණයට පිටවීමේ දොරටු ස්ථාපිත කර ඇති බව සහතික කළ යුතු අතර මෙම අවශ්‍යතාවයන් සපුරා නොමැති ව්‍යාපාරක ස්ථානවලට වෙළඳ බලපත්‍ර ලබානොදිය යුතුය.

29. මෝසම් වැසි සමයද ඇතුළුව සෑම අවස්ථාවකම අකුණු සැර වලින් ආරක්ෂා වීමේ හා ගිගිරුම් සහිත කාලගුණ තත්ත්වයක් පවතින අවස්ථාවල විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව අදළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව සභා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සභාවේ කාර්යය විය යුතුය.

30. ආපද අවදානම් අවස්ථාවක දිවි ගලවා ගැනීමේ සහ ප්‍රථමාධාර ලබා දීම සඳහා ස්වේච්ඡා කමිටු පිහිටුවිය යුතු අතර අදල තාක්ෂණික ආයතනවල සහය ඇතිව ඔවුනට අවශ්‍ය පුහුණු වීම් ලබාදීම සභාවේ කාර්යය විය යුතුය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථා යටතේ

(අ) ආපද අවදානම් අවස්ථාව අවම කිරීම සඳහා ; සහ

(ආ) ආපද අවදානම් අවස්ථාවලදී සහන සැලසීම සඳහා,

ආපද කළමනාකරණ අරමුදලේ මුදල් ප්‍රමාණයන් ද ඇතුලත් වනසේ ප්‍රමාණවත් වැය ප්‍රතිපාදන සභාවේ අයවැය ලේඛනයට ඇතුලත් කරනු ලබන බවට වග බලා ගැනීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

මේ අතුරු ව්‍යවස්ථාව යටතේ මහා සභාව විසින් ගනු ලැබූ තීරණය කුමක් ද යන්න අප්‍රමාදව විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීම ලේකම්ගේ කාර්යය විය යුතුය.

32. (1) කිසියම් සංවිධානයක් විසින් හෝ යම් තැනැත්තෙකු විසින් මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී සභාවට දැරීමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා මුල්‍යාධාර සපයනු ලැබිය හැකිය. නැතහොත් එකී කාර්යයන්ට අවශ්‍ය උපකරණ, ආම්පන්න හෝ ද්‍රව්‍යමය ආධාර සපයනු ලැබිය හැකිය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ සභාවට සපයනු ලබන මූල්‍ය ආධාර සභා අරමුදලට ගෙවිය යුතුවාක් හැර එසේ සපයනු ලබන මුදල් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා පමණක් යොදවනු ලැබිය යුතුය.

(3) ඉහත (2) ඡේදය යටතේ සභාවට ගෙවනු ලබන මුදල් පිළිබඳව වෙනම ගිණුම් තොරතුරු පවත්වාගෙන යාම ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර එකී අරමුදල සභාවේ ආපද කළමනාකරණ ගිණුම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. මෙම අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලාවක් සකස් කර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

(4) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ සභා අරමුදලට ලැබෙන හා ඒ අරමුදලෙන් වියදම් කරනු ලබන මුදල් පිළිබඳව වාර්තාවක් කමිටුවේ සෑම රැස්වීමකදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එකී කමිටු රැස්වීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ රැස්වීමේදී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතුය.

33. (1) නගර සභා ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව, සභා ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්වරුවන්, සභා ප්‍රදේශයට අයත් වන වෙනත් පළාත් පාලන ආයතන, සභා ප්‍රදේශය ඇතුළත හා ඒ ආසන්නයේ පිහිටා ඇති වෙනත් රාජ්‍ය ආයතන සහ සභා ප්‍රදේශය ඇතුලත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන සතුව පවත්නා ආපද කළමනාකරණයට අදල වන්නාවූ දත්ත හා තොරතුරු සභාවේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටි ඕනෑම අවස්ථාවකදී සභා ලේකම්වරයා වෙත ලබාදීම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු වන විට ඔහුගේ කාර්යය විය යුතුය.

(2) ඒ ආකාරයෙන්ම නගර සභාව සතුව පවතිවන ආපද කළමනාකරණයට අදළ දත්ත හා තොරතුරු එකී යම් ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඒ ආයතනයට එකී දත්ත හා තොරතුරු ලබාදීම සභා ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

(3) ඉහත (1) වන හා (2) වන ඡේදවල කුමක් සඳහන්ව තිබුණද, කවර හෝ තැනැත්තෙකු විසින් එසේ ඉල්ලා සිටිනු යම් දත්ත හෝ තොරතුරු පිටතට ලබා දීමෙන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් වන්නේ යයි එකී දත්ත හා තොරතුරු සතුව පවත්නා ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරනු ලබන වෙනත් යම් තැනැත්තෙකුගේ මතය වන අවස්ථාවක, එසේ රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් විය හැකි දත්ත හා තොරතුරු පිටතට ලබාදීමෙන් වැලකී සිටීමට ඒ තැනැත්තාට එකී ඡේදවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

34. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම

35. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ඕනෑම අවස්ථාවක් අදහස්වේ. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

36. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව සභාවේ සභාපති, ලේකම් හෝ බලය ලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර එම නිලධාරියා විසින් මූලික විමර්ෂණයක් පවත්වා විසඳුම් ලබාදීමට පියවර ගනු ලබන්නේය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

37. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

දඩ හා දණ්ඩන

38. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 255 වන අධිකාරිය වූ නගර සභා ආඥාපනතේ 153(2) වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත 153 (2) වගන්තියේ සඳහන් ආකාරයේ අතිරේක දඩයකට යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල

"සභාපතිවරයා" යන්නෙන් අදල නගර සභාවේ සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බලතල කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් තැනැත්තෙක් ද

"උපසභාපතිවරයා" යන්නෙන් අදල නගර සභාවේ උප සභාපතිවරයා ද

"ලේකම්වරයා" යන්නෙන් අදල නගර සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද

"නගර සභාව" යන්නෙන් අදල නගර සභාව ද

"මහා සභාව" යන්නෙන් නගර සභාවේ මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම ද අදහස්වේ.

"ආපද සහ අවදනම්" යන්නෙන් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන පනතෙහි "ව්‍යවසනය" යන්නට දී ඇති අර්ථය අදහස් වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නාවූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ හෝ නැතහොත්, යම් දේපලක් විනාශ කරන්නා වූ හෝ, හානියට පමුණුවන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වභාවිකව හෝ මිනිසා විසින් සිදුකරනු ලබන්නා වූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්නවීම අදහස් වන අතර ඊට,

(අ) නායයෑමක්
(ආ) සුළි සුළඟක්
(ඇ) ගංවතුරක්
(ඈ) නියඟයක්
(ඉ) කාර්මික උපද්‍රවයක්
(ඊ) සුනාමියක් (භූ කම්පනාසන්න චලනයක්)
(උ) භූමිකම්පාවක්
(ඌ) ගුවන් උපද්‍රවයක්
(එ) සමුද්‍රීය උපද්‍රවයක්
(ඒ) ගින්නක්
(ඔ) වසංගතයක්
(ඕ) පිපිරීමක්
(ක) ගුවන් ප්‍රහාරයක්
(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්
(ච) රසායනික අනතුරක්
(ජ) විකිරණශීලීත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්
(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීමක්
(ඩ) න්‍යෂ්ඨික ආපදවක්
(ණ) නාගරික සහ වනාන්තර ගිනිගැනිමක්
(ත) වෙරළ ඛාදනය වීමක් සහ
(ද) ටොනාඩෝ, චන්ඩමාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගුරුම් සහිත කුණාටුවක් ඇතුලත්වේ.

"සහන සැලසීම" යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා ආපද යන්නට දී ඇති අර්ථ නිරූපනයට අනුව කවර හෝ අවස්ථාවකදී හෝ කිසියම් ආපදවක් නිශ්චිතව ඇති වීමට ඉඩ ඇති යම් අවස්ථාවකදී එකී ආපද තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වීමට ඉඩ තිබෙන හෝ පීඩාවට පත්වූ තැනැත්තන් තාවකාලිකව ආරක්ෂිත ස්ථානයක හෝ ස්ථානවල ස්ථාන ගත කිරීම, ජීවිත ගලවා ගැනීම, ප්‍රථමාධාර ලබාදීම, ආපද තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වී ඇති හා අවතැන් වූවන් තාවකාලික නවාතැන් වලින්

ඉවත්ව යන කාලය අතර තුර ඒ තැනැත්තන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම අදහස් වන අතර එසේ අවතැන් වී ඇති තැනැත්තන්ට පිසූ හෝ වියලි ආහාර සැපයීම ද ඊට ඇතුළු විය යුතුය.

පළමුවන උපලේඛනය උපලේඛන

(1) සභා බල ප්‍රදේශයට බලපාන ආපද හා එම ආපද බලපාන ප්‍රදේශ කවරේද යන්න හඳුනා ගැනීම.

(2) ආපද තත්ත්වයන්ට හේතු වන හෝ හේතු විය හැකි කාරණා කවරේද යන්න නිගමනය කිරීම.

(3) ආපද තත්ත්වයන් ඇති වීමට හේතුවන කාරණා වලක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට සහ ආපදවට ලක් වූවන් යථා තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කරන ක්‍රමෝපායන් හඳුනාගැනීම.

(4) කිසියම් ආපද තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවකට පත්වීමට ඉඩ තිබෙන ප්‍රදේශ සහ පවුල් කවරේද යන්න නිශ්චිතව හඳුනාගැනීම, එසේ හඳුනාගැනීමේදී සිසුන්, ළමයින්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් පිළිබඳ විස්තර වෙන් වෙන්ව සටහන් කර තබා ගැනීම.

(5) කවර හෝ ආපද තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවට පත්වන පවුල්වලට සහන සැලසීමේ ක්‍රමෝපායන් නිගමනය කිරීම.

(6) කිසියම් ආපද තත්ත්වයක් හේතුවෙන් අවතැන්වන ජනතාව තාවකාලිකව පදිංචි කරවිය හැකි ස්ථාන ආපද සිදුවීමට පෙර හඳුනා ගැනීම.

(7) කිසියම් ආපද තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාවට, නැවත පදිංචි වන අවස්ථාව දක්වා ආහාරපාන ලබාදීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනාගැනීම.

(8) කිසියම් ආපද අවස්ථාවකදී සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ඇති කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනාගැනීම.

(9) කිසියම් ආපදා තත්ත්වයක් ඇති වීමට වඩාත් ඉඩ තිබෙන කාල වකවානු කවරේද යන්න නිශ්චය කර හඳුනා ගැනීම.

(10) වාහන ගමනාගමනයට අවහිර වන ආකාරයෙන් සිදුවන හෝ සිදු විය හැකි ඕනෑම ආපද අවස්ථාවකදී ඒ මාර්ග වෙනුවට යොදා ගත හැකි විකල්ප මාර්ග කවරේද යන්න හඳුනා ගැනීම.

(11) ගංවතුර ගැලීමකදී මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ කුමන ප්‍රමාණයක වර්ෂාපතනයක් ඇති වූ විට දී යන්න සහ එම වර්ෂාපතනය පතිතවීම කොපමණ කාලයකින් මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ ද යන්න හඳුනාගැනීම.

(12) ඕනෑම ජල ගැලීමක දී ප්‍රදේශ ජලයෙන් යටවීම සිදු වීමට තරමේ වර්ෂාපතනයක් ඇති වී කොපමණ කාලයකින් එම ප්‍රදේශ ජලයේ යටවීම සිදුවන්නේ ද යන්න සහ සුළි සුළඟක් හෝ ඒ ආසන්න කුණාටු තත්ත්වයකදී ඇතිවන අනපේක්ෂිත වර්ෂා තත්ත්වයකදී ප්‍රදේශ ජලයෙන් යටවන ස්ථානයන් හඳුනා ගැනීම.

(13) ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව සභා බල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක අඩුවියදම් වර්ෂා මාපක සවි කිරීමට කටයුතු කිරීමට සහ එම වර්ෂා මාපක දත්ත එකතු කිරීමට කටයුතු කිරීම.

(14) සභා ප්‍රදේශයේ ජනතාවට දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රම වලින් පානීය ජලය ලබාගැනීමට නොහැකි වන කාලවකවානු සහ හේතු හඳුනාගැනීම.

(15) දේපළවලට හෝ ජනතාවට හානිවිය හැකි ආකාරයෙන් සභා ප්‍රදේශ ඇතුලත ගිනි ගැනීම් ඇතිවිය හැකි අවදනම් ස්ථාන හඳුනාගැනීම සහ සිතියම් ගත කිරීම.

(16) සභා ප්‍රදේශයේ ඇති බෑවුම් සහිත ස්ථානවල නායයාමේ අවදානමක පැවතිය හැකි ස්ථාන අදාල තාක්ෂණික ආයතනවල සහය ඇතිව හඳුනා ගැනීම

(17) සභා ප්‍රදේශය ඇතුළත වසංගත රෝග ඇතිවීම සහ පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදයන් අදාල සෞඛ්‍ය ආයතනයේ සහය ඇතිව හඳුනා ගැනීම.

(18) වහා ගිනි ඇවිලෙන සුළු හෝ පිපිරුම් ඇති කරන සුළු හෝ අන්තරායකර රසායන ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, සභා ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක ස්ථාන ගත කර හෝ තැනින් තැන ගෙන යමින් ක්‍රියාත්මක වන කර්මාන්ත හා කර්මාන්තකරුවන් හඳුනාගැනීම හා ලියාපදිංචි කිරීම.

(19) කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් ආපද කළමනාකරණයට අදාළව රැස්කර ගනු ලබන දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම.

(20) සභා ප්‍රදේශය ඇතුලත් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින් ආපද කළමනාකරණයට අදාලව එකී කමිටුව සතු දත්ත හා තොරතුරු ලබා ගැනීම සහ සභාව සතු දත්ත හා තොරතුරු දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව වෙත ලබාදීම සහතික වීම.

(21) කිසියම් ආපද හෝ අවදානම් අවස්ථාවකදී සහන කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට හැකියාව තිබෙන හා පහසුවෙන් සහය ලබා ගත හැකි තැනැත්තන්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේද යන්න හා ඔවුන් සතුව පවතින උපකරණ හඳුනා ගැනීම.

(22) ආපද හෝ අවදානම් අවස්ථාවකදී ජීවිත ගලවා ගැනීමේ කාර්යන්හි ස්වේච්ඡාවෙන් නියුක්ත වීමට කැමති තැනැත්තන් හඳුනාගෙන ඔවුන් ලියාපදිංචි කිරීම හා ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(23) කිසියම් ආපද තත්ත්වයක් ඇතිවීම පිළිබඳ පූර්ව දැනුම් දීම සඳහා හෝ ආපද සහන සැලසීම සඳහා සභාව විසින් මිලදී ගනු ලැබිය යුතු උපකරණ හෝ වෙනත් යම් දේ පිළිබඳව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

(24) කමිටුව විසින් රැස් කරගනු ලැබූ දත්ත, තොරතුරු සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳව කමිටුවේ නිර්දේශයන් සභාවට ඉදිරිපත් කිරීම.

03-14/1

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

................................ ප්‍රාදේශීය සභාව

**ආපදා කළමනාකරණය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ ix වැනි උපවගන්තියේ (ඇ) ඡේදයෙන් ආපදා කළමනාකරණය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර 1952 අංක 6

දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවලට බලය පවරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2016 ජනවාරි මස 05 වැනි දින,
පල්ලේකැලේ,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ආපදා කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය සමඟ කියවිය යුතු 126 (ix) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

2. මේ අතුරු ව්‍යවස්ථා, ආපද කළමනාකරණයට අදළ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අතිරේකයක් ලෙස මිස, එකී යම් විධිවිධානයක බලය හීන කරවන්නේ යයි හෝ එම විධිවිධානවලට අතිරේකයක් ලෙස මිස, එකී යම් විධිවිධානයක බලය හීන කරවන්නේ යයි හෝ එම විධිවිධානවලට ආදේශකයක් වන්නේ යයි නොසැලකිය යුතුය.

අතුරු ව්‍යවස්ථාවේ නාමය

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආපද කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති වීමට ඉඩ ඇති ආපද අවස්ථා අවම කිරීම, එවැනි යම් ආපදවකදී අපහසුතාවට පත්වන්නන් හෝ පත්වීමට ඉඩ ඇති තැනැත්තන්ට සහන සැලසීම සහ සභා බල ප්‍රදේශයේ ආපද අවස්ථාවකදී ඊට මුහුණදීමට හැකි වන අයුරින් පූර්ව සූදනම් කිරීම සඳහා ද ආපද අවදනම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කල යුතු පූර්ව ආපද ක්‍රියාදමයන් සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුශාංගික සියලු කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මේ අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

ඉටුකළ යුතු කාර්යයන්

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති විය හැකි ආපද කළමනාකරණය කිරීම, සහ එවැනි යම් ආපද තත්ත්වයක් ඇති වූ විට එම ආපදාවන්ට ලක් වූ හෝ ලක් විය හැකි අයට සහන සැලසීම හා ආපද අවදනම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු පූර්වෝපායන් නිර්ණය කිරීම ප්‍රාදේශීය සභා ආපද කළමනාකරණ කමිටුව මගින් සිදු කළ යුතුය.

6. කමිටුවේ සංයුතිය

5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව 23කට නොවැඩි විය යුතු අතර, කාන්තාවන්ද, නියෝජනය වන පරිදි එම සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා
(ii) කමිටුවේ ලේකම්වරයා විය යුතු ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා
(iii) සෑම වර්ෂයකම දෙසැම්බර් මස මහ සභාවේ දී ඉදිරි වර්ෂය සඳහා ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන ප්‍රාදේශීය සභාවේ සභිකයන් හතරදෙනෙකු
(iv) ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී
(v) ප්‍රාදේශීය සභාවේ ගිණි නිවීමේ අංශයේ ස්ථානභාර නිලධාරියා/ප්‍රධාන ගිණි භට
(vi) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ පත්කරනු ලැබ ඇති දිස්ත්‍රික් ආපද කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු
(vii) සභා ප්‍රදේශය ඇතුලත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු

(viii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් නම් කරන යම නියෝජිතයෙකු

(ix) සභා ප්‍රදේශය ඇතුලත් වන පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු

(x) සෑම වර්ෂයකම දෙසැම්බර් මස මහා සභාවේදී යෝජනා සම්මතයෙන් ඉදිරි වර්ෂය සඳහා තෝරාපත් කර ගනු ලබන

(අ) අවම වශයෙන් සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක නාගරික සංවර්ධන උපදේශක කමිටුවේ නියෝජිතයන් තුන්දෙනෙකු

(ආ) සභා ප්‍රදේශයේ රජයේ පාසල් ඇතුලත් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු

(ඇ) සභා බල ප්‍රදේශයට අයත් වාණිජ මණ්ඩලය හෝ වෙළඳ සංගමයේ නියෝජිතයෙක්

(ඈ) ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු

(ඉ) ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ස්ථානභාර නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙක්

(ඊ) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයෙක්

(උ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජිතයෙක්

(ඌ) පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙක්

ඉහත 6(iii) වන අනුඡේදය යටතේ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ යම් සභිකයෙකු කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම නිසා හෝ වෙනත් කවර හෝ හේතුවක් මත සභාවේ ධූරය හිස් කිරීම නිසා හෝ කමිටුවේ සාමාජික ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන යම් අවස්ථාවක, එසේ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ ඊළඟ රැස්වීමේදී එකී පුරප්පාඩුව සඳහා සභාවේ වෙනත් යම් සභිකයෙකු ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර එසේ තෝරා පත් කර ගනු ලබන සභිකයාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින තෙක් ඒ සාමාජික ධූරයේ කටයුතු කරනු ලැබිය යුතුය.

කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ යම් තැනැත්තෙකු කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විම නිසා හෝ වෙනත් කවර හෝ හේතුවක් මත කමිටුවේ සාමාජික ධූරය හිස් කිරීම නිසා හෝ කමිටුවේ සාමාජික ධූරයක පුරප්පාඩුවක් ඇතිවී තිබෙන යම් අවස්ථාවක එසේ පුරප්පාඩුව ඇති වීමෙන් පසුව පවත්වනු ලබන මහා සභාවේ ඊළඟ රැස්වීමේදි එකී පුරප්පාඩුව සඳහා වෙනත් යම් තැනැත්තෙකු පත්කර ගනු ලැබිය යුතුය. තවද එසේ තෝරාපත් කරගනු ලබන තැනැත්තාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින තෙක් ඒ සාමාජික ධූරයේ කටයුතු කරනු ලැබිය හැකිය.

ඉහත 6 (iv), (v) සහ (ix) වන අනුඡේදවල සඳහන් කිසියම් නිලධාරියෙකුට යම් කමිටු රැස්වීමකට පෞද්ගලිකව සහභාගිවීමට නොහැකි වන අවස්ථාවක ඔහු විසින් නම් කරනු ලබන හා ඔහුගේ රාජකාරී ආවරණය කරනු ලබන වෙනත් නිලධාරියෙකු ආයතන ප්‍රධානියාගේ අනුදැනුම ඇති ව කමිටු රැස්වීමට සහභාගි කරවිය හැකිය.

7. (1) අවම වශයෙන් සෑම මාස දෙකකට එක් වරක් හෝ කමිටුවේ සාමාන්‍ය රැස්වීමක් පැවැත්විය යුතුය. කමිටුවේ සභාපතිවරයා විසින් උචිත යයි අදහස් කරනු ලබන යම් අවස්ථාවක කමිටුවේ විශේෂ රැස්වීම් කැඳවීමට කමිටුවේ සභාපතිවරයාට බලය තිබිය යුතුය.

(2) කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය, සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති යම් අවස්ථාවක සභාවේ උපසභාපතිවරයා විසින් හෝ දරනු ලැබිය යුතුය. සභාවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා යන දෙදෙනාටම යම් කමිටු රැස්වීමකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් 5 වන අතුරු ව්‍යවස්ථාවේ (1) (iii) අනුඡේදයේ සඳහන් සභාවේ සාමාජිකයින් අතුරින් කෙනෙකු එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාපත් කරගනු ලැබිය යුතුය.

(3) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය මුලු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(4) කමිටුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම එදින රැස්වීමට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(5) සභාවේ ලේකම්වරයා විසින් කමිටුවේ දී ගනු ලබන තීරණ වාර්තා පොතක සටහන් කරනු ලැබිය

යුතු අතර කමිටුවේ ඊලඟ රැස්වීමේදී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමග ඒවා ස්ථිර කරනු ලැබූ විට කමිටුවේ මූලාසනය දරනු ලබන තැනැත්තා විසින් එයට අත්සන් තැබිය යුතුය.

8. කමිටුවේ කිසිදු ක්‍රියාවක් හෝ කාර්යයක් ඒ කමිටුවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමේ දී යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු හෝ බල රහිත වන ලෙස සලකනු නොලැබිය යුතුය.

9. කමිටුවේ සෑම රැස්වීමකම වාර්තා එළඹෙන ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දැන ගැනීම සඳහා සභාගත කළ යුතුය.

10. කමිටුව විසින් මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන යම් නිර්දේශ වන්නේ නම්, ඒවා සම්බන්ධයෙන් සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව මහා සභාව විසින් සලකා බලනු ලැබිය හැකිය.

11. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ සඳහන් කාර්යයන් කමිටුවේ කාර්යය විය යුතුය.

12. (1) සභාපතිවරයා සහා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළඳ ස්ථානයක දෛනික කාර්යයන් අවසානයේ එකී කාර්යාල හෝ වෙළඳ ස්ථානය වසා දැමීමට පෙර, ඒ පරිශ්‍රය ඇතුළත දල්වා තබන ලද

(අ) භූමිතෙල් භාවිතා කරන ලාම්පුවක් හෝ
(ආ) පොල්තෙල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් දල්වා තබනු ලබන යම්කිසි පහනක්
(ඇ) හඳුන්කූරක් හෝ එවැනි වෙනත් යම් දෙයක් හෝ
(ඈ) එවැනි විවෘත දැල්ලක් සහිත වෙනත් යම් දෙයක්, හෝ නිවා දැමීම කළ යුතු බවට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළඳ ස්ථානයක හිමිකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී යම් ස්ථානයක භාරකරු හෝ විසින් (1) ඡේදයේ සඳහන් නියමය පිළිපැදීමට යටත් තැනැත්තා වන අතර ඔහු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු ලවා හෝ එසේ කිරීම සැලැස්වීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතුය.

13. සභා ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති ඛණිජ තෙල් පිරවුම් ස්ථාන, ඛණිජ තෙල් ගබඩා කිරීමේ ස්ථාන, එල්. පී. ගෑස් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණනු ලබන ස්ථාන සහ එල්. පී. ගෑස් ගබඩා කරන ටැංකි පවත්වාගෙන යනු ලබන ස්ථානවල - නොකළ යුතු කාර්යයන්

(1) (අ) ගිනි දැල්වීම හෝ ගිනි දැල්වීමට ඉඩ දීම හෝ
(ආ) යම් තැනැත්තෙකු විසින් විවෘත ගිනි දැල්ලක් ඇති ව සිටීම හෝ සිටීමට කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

(2) රක්ෂණ සහතිකයක් සහ ගිනි නිවීමේ උපකරණ හා ද්‍රව්‍ය නොමැතිව ව්‍යාපාර පවත්වාගෙන යාම නොකළ යුතුය.

14. සභා ප්‍රදේශය ඇතුලත පිහිටා ඇති කාර්යාල සහ වෙළඳ ස්ථාන පවත්වාගෙන යනු ලබන කිසියම් ගොඩනැගිල්ලක විදුලි පරිපථ පූර්ණ ආරක්ෂාව සහිතව සවිකර පවත්වාගෙන යාම එකී ගොඩනැගිල්ල හිමිකරුගේ සහ පදිංචිකරුගේ කාර්යය විය යුතු අතර අනාරක්ෂිත විදුලි රැහැන් ඇදීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

15. සභා බල ප්‍රදේශය ඇතුලත පුද්ගලික හෝ රජය සතු ඉඩම්වල ස්වභාවිකව වැසි ජලය බැස යාම අවහිර වන සේ ඉඩම් කට්ටි කිරීම, තාවකාලිකව හෝ ස්ථිරව ගොඩනැගිල්ලක් හෝ තාප්පයක් හෝ බැම්මක් ඉදිකිරීම නොකල යුතුවේ.

16. සභා බල ප්‍රදේශයේ ස්වභාවික උවදුරුවලට ගොදුරු විය හැකි ඉඩම්වල මෙන්ම අංශක 30ට වඩා වැඩි බෑවුම් සහිත ඉඩම්වල සභාවේ අනුමැතියකින් තොරව නිවාස ඉදිකිරීම නොකළ යුතුවේ.

17. ස්වාභාවික බෑවුම අංශක 30ට වඩා වැඩි ඉඩම්වල ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව පිළියෙල කරන ලද නිර්ණායකයන්ට අනුකූල නොවන සේ පස් කැපීම හෝ ඉවත් කිරීම සිදු නොකළ යුතුය.

පළාත් පාලන ආයතනයේ කාර්යය භාරය

18. (1) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පෙර ආපදවලට ලක්වූ හා ලක්විය හැකි ප්‍රදේශයන් දැක්වෙන සිතියම් සකස් කර දත්ත ගබඩාවක් පවත්වාගෙන යා යුතු අතර මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රදර්ශනය කළ යුතුය.

(2) බල ප්‍රදේශයේ ආපදවට ලක්විය හැකි ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි ස්ථාන සිතියම් ගත කිරීම හා ඒ පිළිබඳව මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

(3) ආපද අවදනම් ස්ථාන පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස භාෂා ත්‍රිත්වයෙන් පුවරු සවිකර යාවත්කාලීන කළ යුතුය.

(4) ආපදවට ලක්විය හැකි බවට හඳුනාගත් ප්‍රදේශවල සිදුවිය හැකි ආපද අවම කිරීම පිණිස ආපද කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදළ අනෙකුත් ආයතන දැනුවත් කර ඔවුන්ගේද සහය ඇතිව ආපද අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

19. (1) සියළුම සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අදල අනුමැතිය ලබාදීමේදී අදාළ ප්‍රදේශයේ පවතින ආපද තත්වයන් පිළිබඳ ඇගයීමත්, ආපද අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් ආපද කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාගත යුතු අතර අධි අවදනම් තත්වයන්ට ලක්විය හැකි වන්නේ නම් ආපද අවම කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත කොට වරලත් ඉංජිනේරුවකු/වාස්තු විද්‍යාඥයෙකු/භූ විද්‍යාඥයෙකුගේ සහතිකයක් සහිතව සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

(2) බල ප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් දැනට ආපද කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිහිටුවා ඇති ආපද කළමනාකරණ කමිටු සමග සම්බන්ධව කටයුතු කළ යුතුය.

20. ආපදවන්ට ලක්වූ ප්‍රදේශය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා අනෙකුත් අදළ ආයතන සම්බන්ධ කර ගෙන ආපදවන්ට ලක් වූවන්ට සහන සැලසීම සඳහා දැනට රජයේ ක්‍රියාත්මක වන ක්‍රමවේදය තුළට සම්බන්ධව වී කටයුතු කළ යුතුය.

21. ආපද තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන බවට ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව කමිටුව විසින් හඳුනාගනු ලැබූ,

(1) ආපද අවදනම් කලාප, ඒ එක් එක් කලාපයට ආපද ඇති වීමට බලපාන හේතු සහ ප්‍රදේශය ආපදවකදී එයින් පීඩාවට පත් වන්නන් ඉවත් කර ගැනීමට වඩාත් සුදුසු මාර්ග හා අවතාන් වූවන් තාවකාලිකව රඳවා තැබිය හැකි ස්ථාන කවරෙද යන්න පහසුවෙන් සොයා ගත හැකි ආකාරයට සිතියම් ගත කිරීම සහ එම සිතියම් යාවත්කාලීනව පවත්වා ගැනීම.

(2) ආපද අවදනම් කලාප ඇතුළත පදිංචි ජනතාවගේ ජන ජීවිතයට කිසියම් බලපෑමක් ඇති කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් වෙන් වෙන්ව නිශ්චිතව හඳුනාගැනීම.

(3) ආපද අවදනම් කලාප ඇතුළත මහා පරිමානයේ ආපදවක් හේතුවෙන් අවතැන්වීමට ඉඩ තිබෙන පවුල් තාවකාලිකව පදිංචි කරවීම සුදුසු බවට කමිටුව විසින් හඳුනාගනු ලැබ තිබෙන ස්ථානවලට අවශ්‍ය උපකරණ සපයා ගැනීම සඳහා අදළ ආයතන හඳුනාගෙන තිබීම.

(4) ආපද අවදනම් තත්ත්වයන් අවම කිරීම සහ ආපදවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා කාර්යයන් සභාවේ සභිකයන්, ප්‍රජාව ආපද කළමනාකරණ මධ්‍යස්ථානය සහ වෙනත් පාර්ශ්වකරුවන් සමග එක්ව හඳුනාගැනීමට ක්‍රියා කිරීම.

(5) ආපද අවදනම් තත්ත්වයන් අවම කිරීම හා ආපදවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමේ ප්‍රමුඛතා සැලසුම් කිරීම සහ එකී සැලසුම් යාවත්කාලීන කිරීමට ක්‍රියා කිරීම, සහ

(6) ආපද තත්ත්වයක් ඇතිවූ අවස්ථාකව එහි පදිංචි ජනතාවට සහන සැලැසීම සඳහා කමිටුව විසින් හඳුනා ගෙන ඇති කණ්ඩායම් සාමාජිකයන්ට ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ සහය ඇතිව සහන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

22. (1) ව්‍යයසන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන තාක්ෂණික ආයතනවල උපදෙස් මත ආපද කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් වාර්තා තබාගැනීම සඳහා සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු නිශ්චිතව යෙදවීම සභාවේ කාර්යය භාරය වන්නේය.

(2) සභා බල ප්‍රදේශයට බලපෑ හැකි උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන ආපද කළමනාකරණ කමිටුවට කමිටුවේ සභාපතිවරයාට හෝ කමිටු සාමාජිකයන්ට දැනුම්දීම කාර්යය පැවරූ නිලධාරියා හෝ සේවකයාගේ වගකීම වන්නේය.

(3) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසියම් ආපද අවදනම් කලාපයක ආපද අවදනමක් ඇති වීඹට ඉඩ ඇති අවස්ථාවක හෝ එවැනි අවදනමක් ඇති වී තිබෙන අවස්ථාවක, අවදනමට ලක්වීමට ඉඩ ඇති හෝ අවදනමට ලක් වූ තැනැත්තන් වෙත සහන සැලසීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න තීරණය කිරීම කමිටුව විසින් කරනු ලැබිය හැකිය. ආපදවන්ට ලක් වූවන්ගේ ජීවිත ආරක්ෂාව, ආහාර, පානීය ජලය, ඇඳුම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ යන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණයක් හෝ තීරණ ගැනීම සඳහා කමිටුව රැස්කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව සභාපතිවරයාගේ මතය වන විට, ඒ අවස්ථාවේදී කළ යුතු සහන සැලසීම පිළිබඳ තීරණ ගැනීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද තමා විසින් ගනු ලැබූ තීරණය හෝ තීරණ කවරේද යන්න කැලැන්ඩර දින තුනක් ඇතුළත කැඳවනු ලබන කමිටුවේ රැස්වීම ඉදිරිපත් කිරීමට සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(4) (3) ඡේදයේ සඳහන් ආකාරයට කමිටුව විසින් හෝ සභාපතිවරයාට විසින් ගනු ලැබූ තීරණයක් හෝ තීරණ යටතේ ආපදවට ලක්වූ තැනැත්තන්ට සහන සැළසීම කළ හැකි අතර ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලෙන් වියදම් කරනු ලැබිය හැකිය.

(5) (3) ඡේදයේ සඳහන් ආකාරයට කමිටුව විසින් හෝ සභාපතිවරයා විසින් ගනු ලැබූ තීරණ, ඒ තීරණයන් අනුව (4) ඡේදය යටතේ ගනු ලැබූ ක්‍රියා මාර්ග සහ ඒ වෙනුවෙන් සභා අරමුදලෙන් දරනු ලැබූ වියදම් කොපමණ ද යන්න පිළිබඳව කමිටුව විසින් පිළියෙල කර සවිස්තර වාර්තාවක් ඒ කාර්යයෙන් පසුව එළඹෙන සභාවේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතුය.

23. සභා බල ප්‍රදේශයේ ස්වභාවික ආපදවලට ගොදුරු විය හැකි ඉඩම් මෙන්ම බෑවුම් $30^0$ වැඩි ඉඩම් හඳුනා ගැනීම සඳහා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහාය ලබාදිය යුතුය.

24. සභා ප්‍රදේශයේ ජල ගැලීම්වලට පාත්‍රවන ප්‍රදේශ හඳුනාගෙන සිතියම් වල සලකුණු කිරීම හා එම එක් එක් ප්‍රදේශවල උපරිම ජල මට්ටම, වර්ෂාපතනය හා අනෙකුත් සාධක පාදක කරගත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් හෝ පසුගිය අත්දැකීම් මත තීරණය කර, නිවාසවල අත්තිවාරම් මට්ටම සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

25. සභා බල ප්‍රදේශය තුළ පතිත වන වර්ෂා ජලය බාධාවකින් තොරව ගලා යෑමට හැකිවන ආකාරයෙන් මතුපිට ජලපවාහන පද්ධතිය ඉදිකිරීම, නඩත්තුව සහ වැසි ජලය ගලා යෑමට පවතින අවහිරතා මග හැරවීමට ක්‍රියා කිරීම සභාවේ කාර්යය විය යුතුය.

(1) සභා බල ප්‍රදේශයේ රජයේ හා පුද්ගලික ඉඩම්වල ඉඩම් අනු බෙදුම් ඉල්ලුම් අනුමත කිරීමේ දී වැසි ජලය ආපද තත්ත්වයක් ඇති නොවන සේ ක්‍රමානුකූලව බැහැරලීමට අවශ්‍ය කාණු පද්ධතිය සැලසුමට ඇතුලත් කර ඇති බව සහතික කළ යුතුයි.

(2) සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබා දීමේදී අදළ ඉඩමේ කට්ටි සැළැස්ම සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති බවට සනාථ කර ගත යුතුවේ.

26. සභා ප්‍රදේශය ඇතුළත ඇති නිවාසවල, වෙළඳ ස්ථානවල සහ වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ප්‍රයෝජනයට ගනු ලබන එල් පී ගෑස් සිලින්ඩරවලට සම්බන්ධ කරනු ලබන උපාංග වලින් හෝ ඒ උපාංග එකිනෙකට සම්බන්ධ කරන ස්ථානවලින් එල්. පී. ගෑස් කාන්දුවීමකින් තොරව පවත්වාගෙන යාම සහ ඒ පිළිබඳ පූර්වාරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් සභා ප්‍රදේශයේ පදිංචි සහ ප්‍රදේශය තුළ ව්‍යාපාරයන් හි නියුක්ත තැනැත්තන් දැනුවත් කිරීමට ක්‍රියා කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

27. එල්පී ගෑස් භාවිතා කරමින් පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී ගිනි රක්ෂණ ආවරණයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, ගිනි රක්ෂණ ආවරණයක් නොමැතිව එවැනි ව්‍යාපාර පවත්වාගෙන යෑමට ඉඩ නොදිය යුතුය.

28. ප්‍රාදේශීය සභාව තුළ පවත්වාගෙන යන ජනතාව විශාල වශයෙන් ඒකරාශිවන උපකාරක පන්ති, වෙළඳ සංකීරණ වැනි ස්ථානයන්හි සිදුවිය හැකි ගිනිගැනීම් වැනි උවදුරු අවස්ථාවලදී ඉතා කෙටි වේලාවකින් ජනතාව ඉවත් කිරීමට හැකිවන අයුරින් අවශ්‍ය ප්‍රමාණයට පිටවීමේ දොරටු ස්ථාපිත කර ඇති බව සහතික කළ යුතු අතර මෙම අවශ්‍යතාවයන් සපුරා නොමැති ව්‍යාපාරක ස්ථානවලට වෙළඳ බලපත්‍ර ලබා නොදිය යුතුය.

29. මෝසම් වැසි සමයද ඇතුළුව සෑම අවස්ථාවකම අකුණු සැර වලින් ආරක්ෂා වීමේ හා ගිගිරුම් සහිත කාලගුණ තත්ත්වයක් පවතින අවස්ථාවල විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව අදළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව සභා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සභාවේ කාර්යය විය යුතුය.

30. ආපද අවදනම් අවස්ථාවක දිවි ගලවා ගැනීමේ සහ ප්‍රථමාධාර ලබා දීම සඳහා ස්වේච්ඡා කමිටු පිහිටුවිය යුතු අතර අදල තාක්ෂණික ආයතනවල සහය ඇතිව ඔවුනට අවශ්‍ය පුහුණු වීම් ලබාදීම සභාවේ කාර්යය විය යුතුය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථා යටතේ

(අ) ආපද අවදනම් අවස්ථාව අවම කිරීම සඳහා ; සහ

(ආ) ආපද අවදනම් අවස්ථාවලදී සහන සැලසීම සඳහා,

ආපද කළමනාකරණ අරමුදලේ මුදල් ප්‍රමාණයන් ද ඇතුලත් වනසේ ප්‍රමාණවත් වැය ප්‍රතිපාදන සභාවේ අයවැය ලේඛනයට ඇතුලත් කරනු ලබන බවට වග බලා ගැනීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

මේ අතුරු ව්‍යවස්ථාව යටතේ මහා සභාව විසින් ගනු ලැබූ තීරණය කුමක් ද යන්න අප්‍රමාදව විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීම ලේකම්ගේ කාර්යය විය යුතුය.

32. (1) කිසියම් සංවිධානයක් විසින් හෝ යම් තැනැත්තෙකු විසින් මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී සභාවට දැරීමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා මූල්‍යාධාර සපයනු ලැබිය හැකිය. නැතහොත් එකී කාර්යයන්ට අවශ්‍ය උපකරණ, ආම්පන්න හෝ ද්‍රව්‍යමය ආධාර සපයනු ලැබිය හැකිය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ සභාවට සපයනු ලබන මූල්‍ය ආධාර සභා අරමුදලට ගෙවිය යුතුවාක් හැර එසේ සපයනු ලබන මුදල් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා පමණක් යොදවනු ලැබිය යුතුය.

(3) ඉහත (2) ඡේදය යටතේ සභාවට ගෙවනු ලබන මුදල් පිළිබඳව වෙනම ගිණුම් තොරතුරු පවත්වාගෙන යාම ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර එකී අරමුදල සභාවේ ආපද කළමනාකරණ ගිණුම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. මෙම අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලාවක් සකස් කර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

(4) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ සභා අරමුදලට ලැබෙන හා ඒ අරමුදලෙන් වියදම් කරනු ලබන මුදල් පිළිබඳව වාර්තාවක් කමිටුවේ සෑම රැස්වීමකදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එකී කමිටු රැස්වීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ රැස්වීමේදී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතුය.

33. (1) ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව, සභා ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්වරුවන්, සභා ප්‍රදේශයට අයත් වන වෙනත් පළාත් පාලන ආයතන, සභා ප්‍රදේශය ඇතුළත හා ඒ ආසන්නයේ පිහිටා ඇති වෙනත් රාජ්‍ය ආයතන සහ සභා ප්‍රදේශය ඇතුලත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන සතුව පවත්නා ආපද කළමනාකරණයට අදල වන්නාවූ දත්ත හා තොරතුරු සභාවේ ලේකම්වරයා විසින් ඉල්ලාසිටි ඕනෑම අවස්ථාවකදී සභා ලේකම්වරයා වෙත ලබාදීම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු වන විට ඔහුගේ කාර්යය විය යුතුය.

(2) ඒ ආකාරයෙන්ම ප්‍රාදේශීය සභාව සතුව පවතිවන ආපද කළමනාකරණයට අදළ දත්ත හා තොරතුරු එකී යම් ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඒ ආයතනයට එකී දත්ත හා තොරතුරු ලබාදීම සහා ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

(3) ඉහත (1) වන හා (2) වන ඡේදවල කුමක් සඳහන්ව තිබුණද, කවර හෝ තැනැත්තෙකු විසින් එසේ ඉල්ලා සිටිනු යම් දත්ත හෝ තොරතුරු පිටතට ලබා දීමෙන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් වන්නේ යයි එකී දත්ත හා තොරතුරු සතුව පවත්නා ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරනු ලබන වෙනත් යම් තැනැත්තෙකුගේ මතය වන අවස්ථාවක, එසේ රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් විය හැකි දත්ත හා තොරතුරු පිටතට ලබාදීමෙන් වැලකී සිටීමට ඒ තැනැත්තාට එකී ඡේදවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

34. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. — බලය පැවරීම

35. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරයෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ඕනෑම අවස්ථාවක අදහස්වේ. — පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

36. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව සභාවේ සභාපති, ලේකම් හෝ බලය ලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර එම නිලධාරියා විසින් මූලික විමර්ෂණයක් පවත්වා විසඳුම් ලබාදීමට පියවර ගනු ලබන්නේය. — පැමිණිලි හා පිළියම් යාන්ත්‍රනය

37. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම

38. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 122(2) වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත 122 (2) වගන්තියේ සඳහන් ආකාරයේ අතිරේක දඩයකට යටත් විය යුතුය. — දඩ හා දණ්ඩන

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල — අර්ථ නිරූපනය හා නිර්වචන

"සභාපතිවරයා" යන්නෙන් අදල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ සභාපතිවරයා ගේ බලතල කර්තව්‍ය පැවරී ඇති යම් තැනැත්තෙක් ද

"උපසභාපතිවරයා" යන්නෙන් අදල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ද

"ලේකම්වරයා" යන්නෙන් අදල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් අදල ප්‍රාදේශීය සභාව ද

"මහා සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම ද අදහස්වේ.

"ආපද සහ අවදානම්" යන්නෙන් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන පනතෙහි "ව්‍යසනය" යන්නට දී ඇති අර්ථය අදහස්වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදයක වන්නාවූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නාවූ හෝ නැතහොත්, යම් දේපලක් විනාශ කරන්නාවූ හෝ, හානියට පමුණුවන්නාවූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නාවූ ද, ස්වභාවිකව හෝ මිනිසා විසින් සිදුකරනු ලබන්නාවූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්නවීම අදහස් වන අතර ඊට,

(අ) නායයෑමක්
(ආ) සුළි සුළඟක්
(ඇ) ගංවතුරක්
(ඈ) නියඟයක්
(ඉ) කාර්මික උපද්‍රවයක්
(ඊ) සුනාමියක් (භූ කම්පනාසන්න චලනයක්)
(උ) භූමිකම්පාවක්
(ඌ) ගුවන් උපද්‍රවයක්
(එ) සමුද්‍රීය උපද්‍රවයක්
(ඒ) ගින්නක්
(ඔ) වසංගතයක්
(ඕ) පිපිරීමක්
(ක) ගුවන් ප්‍රහාරයක්
(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්
(ච) රසායනික අනතුරක්
(ජ) විකිරණශීලීත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්
(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීමක්
(ඩ) න්‍යෂ්ඨික ආපදාවක්
(ණ) නාගරික සහ වනාන්තර ගිනිගැනිමක්
(ත) වෙරළ ඛාදනය වීමක් ; සහ
(ද) ටොනාඩෝ, චන්ඩමාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක් ඇතුලත්වේ.

“සහන සැලසීම” යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා ආපද යන්නට දී ඇති අර්ථ නිරූපනයට අනුව කවර හෝ අවස්ථාවකදී හෝ කිසියම් ආපදවක් නිශ්චිතව ඇති වීමට ඉඩ ඇති යම් අවස්ථාවකදී එකී ආපද තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වීමට ඉඩ තිබෙන හෝ පීඩාවට පත්වූ තැනැත්තන් තාවකාලිකව ආරක්ෂිත ස්ථානයක හෝ ස්ථානවල ස්ථාන ගත කිරීම, ජීවිත ගලවා ගැනීම, ප්‍රථමාධාර ලබාදීම, ආපද තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වී ඇති හා අවතැන් වූවන් තාවකාලික නවාතැන් වලින් ඉවත්ව යන කාලය අතර තුර ඒ තැනැත්තන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම අදහස් වන අතර එසේ අවතැන් වී ඇති තැනැත්තන්ට පිසූ හෝ වියලි ආහාර සැපයීම ද ඊට ඇතුළු විය යුතුය.

උපලේඛන

පළමුවන උපලේඛනය

(1) සභා බල ප්‍රදේශයට බලපාන ආපද හා එම ආපද බලපාන ප්‍රදේශ කවරේද යන්න හඳුනා ගැනීම.

(2) ආපද තත්ත්වයන්ට හේතු වන හෝ හේතු විය හැකි කාරණා කවරේද යන්න නිගමනය කිරීම.

(3) ආපද තත්ත්වයන් ඇති වීමට හේතුවන කාරණා වලක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට සහ ආපදවට ලක් වූවන් යථා තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කරන ක්‍රමෝපායන් හඳුනාගැනීම.

(4) කිසියම් ආපද තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවකට පත්වීමට ඉඩ තිබෙන ප්‍රදේශ සහ පවුල් කවරේද යන්න නිශ්චිතව හඳුනාගැනීම, එසේ හඳුනාගැනිමේදී සිසුන්, ළමයින්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් පිළිබඳ විස්තර වෙන් වෙන්ව සටහන් කර තබා ගැනීම.

(5) කවර හෝ ආපද තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවට පත්වන පවුල්වලට සහන සැලසීමේ ක්‍රමෝපායන් නිගමනය කිරීම.

(6) කිසියම් ආපද තත්ත්වයක් හේතුවෙන් අවතැන්වන ජනතාව තාවකාලිකව පදිංචි කරවිය හැකි ස්ථනා ආපද සිදුවීමට පෙර හඳුනා ගැනීම

(7) කිසියම් ආපද තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාවට, නැවත පදිංචි වන අවස්ථාව දක්වා ආහාරපාන ලබාදීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනාගැනීම.

(8) කිසියම් ආපද අවස්ථාවකදී සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ඇති කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනාගැනීම.

(9) කිසියම් ආපදා තත්ත්වයක් ඇති වීමට වඩාත් ඉඩ තිබෙන කාල වකවානු කවරේද යන්න නිශ්චය කර හඳුනා ගැනීම.

(10) වාහන ගමනාගමනයට අවහිර වන ආකාරයෙන් සිදුවන හෝ සිදු විය හැකි ඕනෑම ආපද අවස්ථාවකදී ඒ මාර්ග වෙනුවට යොද ගත හැකි විකල්ප මාර්ග කවරේද යන්න හඳුනා ගැනීම.

(11) ගංවතුර ගැලීමකදී මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ කුමන ප්‍රමාණයක වර්ෂාපතනයක් ඇති වූ විට දී යන්න සහ එම වර්ෂාපතනය පතිතවීම කොපමණ කාලයකින් මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ ද යන්න හඳුනාගැනීම.

(12) ඕනෑම ජල ගැලීමක දී ප්‍රදේශ ජලයෙන් යටවීම සිදු වීමට තරමේ වර්ෂාපතනයක් ඇති වී කොපමණ කාලයකින් එම ප්‍රදේශ ජලයේ යටවීම සිදුවන්නේ ද යන්න සහ සුළි සුළඟක් හෝ ඒ ආසන්න කුණාටු තත්ත්වයකදී ඇතිවන අනපේක්ෂිත වර්ෂා තත්ත්වයකදී ප්‍රදේශ ජලයෙන් යටවන ස්ථානයන් හඳුනා ගැනීම.

(13) ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව සභා බල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක අඩුවියදම් වර්ෂා මාපක සවි කිරීමට කටයුතු කිරීමට සහ එම වර්ෂා මාපක දත්ත එකතු කිරීමට කටයුතු කිරීම.

(14) සභා ප්‍රදේශයේ ජනතාවට දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රම වලින් පානීය ජලය ලබාගැනීමට නොහැකි වන කාලවකවානු සහ හේතු හඳුනාගැනීම.

(15) දේපළවලට හෝ ජනතාවට හානිවිය හැකි ආකාරයෙන් සභා ප්‍රදේශ ඇතුලත ගිනි ගැනීම් ඇතිවිය හැකි අවදනම් ස්ථාන හඳුනාගැනීම සහ සිතියම් ගත කිරීම.

(16) සභා ප්‍රදේශයේ ඇති බෑවුම් සහිත ස්ථානවල නායයාමේ අවදනමක පැවතිය හැකි ස්ථාන අදල තාක්ෂණික ආයතනවල සහය අතිව හඳුනා ගැනීම.

(17) සභා ප්‍රදේශය ඇතුළත වසංගත රෝග ඇතිවීම සහ පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදයන් අදල සෞඛ්‍ය ආයතනයේ සහය ඇතිව හඳුනා ගැනීම.

(18) වහා ගිනි ඇවිලෙන සුළු හෝ පිපිරුම් ඇති කරන සුළු හෝ අන්තරායකර රසායන ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, සභා ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක ස්ථාන ගත කර හෝ තැනින් තැන ගෙන යමින් ක්‍රියාත්මක වන කර්මාන්ත හා කර්මාන්තකරුවන් හඳුනාගැනීම හා ලියාපදිංචි කිරීම.

(19) කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් ආපද කළමනාකරණයට අදළව රැස්කර ගනු ලබන දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම.

(20) සභා ප්‍රදේශය ඇතුලත් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින් ආපද කළමනාකරණයට අදලව එකී කමිටුව සතු දත්ත හා තොරතුරු ලබා ගැනීම සහ සභාව සතු දත්ත හා තොරතුරු දිස්ත්‍රික් ආපද කළමනාකරණ කමිටුව වෙත ලබාදීම සහතික වීම.

(21) කිසියම් ආපද හෝ අවදනම් අවස්ථාවකදී සහන කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට හැකියාව තිබෙන හා පහසුවෙන් සහය ලබා ගත හැකි තැනැත්තන්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේද යන්න හා ඔවුන් සතුව පවතින උපකරණ හඳුනා ගැනීම.

(22) ආපද හෝ අවදනම් අවස්ථාවකදී ජීවිත ගලවා ගැනීමේ කාර්යන්හි ස්වේච්ඡාවෙන් නියුක්ත වීමට කැමති තැනැත්තන් හඳුනාගෙන ඔවුන් ලියාපදිංචි කිරීම හා ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(23) කිසියම් ආපද තත්ත්වයක් ඇතිවීම පිළිබඳ පූර්ව දැනුම් දීම සඳහා හෝ ආපද සහන සැලසීම සඳහා සභාව විසින් මිලදී ගනු ලැබිය යුතු උපකරණ හෝ වෙනත් යම් දේ පිළිබඳව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

(24) කමිටුව විසින් රැස් කරගනු ලැබූ දත්ත, තොරතුරු සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳව කමිටුවේ නිර්දේශයන් සභාවට ඉදිරිපත් කිරීම.

03-14/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.